# 25

# අහ්ලුල් බයිත්වරු හඳුනාගනිමු

**නබි (සල්) තුමාගේ පවුලේ උදවිය අහ්ලුල් බයිත් යනුවෙන් අමතනු ලැබේ.**

නබි (සල්) තුමාගේ දුව වන ෆාතිමා (රළි) නබි (සල්) තුමාගේ බෑනා හා ඥාති සහෝදරයෙකු වන අලි (රළි) සුළු පියවරුන් වන හම්සා (රළි) අබ්බාස් (රළි) මුනුබුරන් හසන් හුසයින් රලියල්ලාහු අන්හුමා යනාදීහු අහ්ලුල් බයිත් අතරට ගැනෙති.

මොවුන්ගේ විශේෂත්වයත්, ඉස්ලාමය වෙනුවෙන් ඉටු කළ කාර්යභාරයත් වටහාගත යුතු ය. එසේම ඔවුන්ගේ ආදර්ශයන් පිළිපැදිය යුතු අතර ඔවුන් කෙරෙහි ඇල්මෙන් කටයුතු කිරීමද අවශ්‍ය වේ.

## ෆාතිමා (රළි) තුමිය

මුහම්මද් (සල්) තුමාට හා කදීජා (රළි) තුමියට දාව නුබුවතයට වසර 5කට පෙර මක්කාවේ මෙතුමිය ඉපදුණා ය. හිජ්රි දෙවන වසරේ අලි (රළි) විවාහ කරගත්තේ ය මෙතුමියට හසන්, හුසයින් නැමැති පිරිමි දරුවනුත්, ගැහැනු දරුවන් තිදෙනෙකුත් ඉපදුනි. ෆාතිමා (රළි) ඉස්ලාමිය වත් පිළිවෙත් වඩාත් හොඳින් අනුගමනය කළා ය. දැඩි දරිද්‍රතාවයේ දී ත් මෙතුමිය ඉවසීමෙන් කටයුතු කළා ය. ආගන්තුකයන්ට ඕනෑකමින් සංග්‍රහ කළා ය. තමන් සතු දෑ දන් දුන්නා ය. දිනක් තමන් සතුව තිබු පොරවනයක් යුදෙව්වෙකුට වික්කා ය. එම අවස්ථාවේ පැමිණි යාචකයාට එම මුදල ද දන් දුන්නා ය.

දිනක් නබි (සල්) තුමාණෝ කඃබාවේ සලාතයේ යෙදී සිටියහ. එවිට කුරෙයිෂි කාෆිර්වරු සමහරෙක් නබි (සල්) තුමාගේ ශරීරයට ඔටුවාගේ බඩවැල් දමූ හ. හිස එසවීමට නොහැකි ව නබි (සල්) තුමාණෝ සුජූදයේ ම සිටියහ. එම අවස්ථාවේ එතැනට පැමිණි දුව ෆාතිමා (රළි) තම දෑතින් ම ඒවා ඉවත් කළා ය.

සලාතයේ යෙදීමෙහිත්, සවුම් රැකීමෙහිත් වැඩි කාලයක් ගත කළා ය. කරුණාව දයාව ලැදියාව මෙන් ම පරිත්‍යාගය මෙතුමිය ළඟ දක්නට ලැබිණි. උඩඟුබව අත්හැර චාම් බව අගය කළා ය.

ෆාතිමා (රළි) තුමිය කෙරෙහි නබි (සල්) තුමාණෝ අධික ලෙස ආදරය දැක්වූහ. 'සමස්ත ලෝක කාන්තාවන්ගේ නායිකාව' වශයෙනුත් 'ස්වර්ගවාසී කාන්තාවන්ගේ නායිකාව' ලෙසිනුත් නබි (සල්) තුමාණෝ ප්‍රශංසා කළහ.

නබි (සල්) තුමාණන් වෆාත්වී මාස 6කට පසුව තම 28 වන වියේ ෆාතිමා (රළි) තුමිය මදීනාවේ දී  වෆාත් වූවා ය.

අභ්‍යාස

කෙටි පිළිතුරු සපයන්න.

1. අහ්ලුල් බයිත්වරු කවුරුන් ද?
2. ෆාතිමා (රළි) තුමිය ඉපදුණෝ කවදා ද?
3. ෆාතිමා (රළි) තුමියගේ සුවිශේෂි ගුණාංගයන් 3ක් ලියන්න.
4. නබි (සල්) තුමාණන් විසින් ෆාතිමා (රළි) තුමිය ප්‍රශංසා කළේ කෙසේද?
5. ෆාතිමා (රළි) තුමිය වෆාත් වන විට වයස කීයද?